නිපුණතා මට්ටම: 17.2 - ව්‍යාපාරයක තොරතුරු පද්ධතියක ඇති වැදගත්කම හා කාර්යභාරය විමසයි.

ව්‍යාපාරයක තීරණ ගැනීම හා පාලනය සඳහා අවශ්‍ය වන තොරතුරු රැස් කිරීම,සැකසීම,ගබඩා කිරීම හා බෙදා හැරීම සඳහා වූ අන්තර් සම්බන්ධතාවකින් යුත් උපාංග සමූහයක එකතුවක් තොරතුරු පද්ධතියක් ලෙස හැඳින්වේ.

තොරතුරු පද්ධතියක් මගින් දත්ත තොරතුරු බවට පත් කෙරේ.

දත්ත තොරතුරු බවට පත් කිරීමේ උපාංග පහත දැක්වේ.

- ආදානය - තොරතුරු පද්ධතිය සඳහා අවශ්‍ය දත්ත එකතු කිරීම ආදානය යන්නෙන් අදහස් වේ.
- සැකසීම - එකතු කරන ලද දත්ත තොරතුරක් බවට පත් කිරීමේ ක්‍රියාවලියයි.
- ප්‍රතිදානය - දත්ත සැකසුම් ක්‍රියාවලිය මගින් සකසන ලද තොරතුරු අවශ්‍ය,අදාළ පාර්ශ්වයන්ට ලබා දීම ප්‍රතිදානයයි.
- ගබඩා කිරීම - පද්ධතිය ජනිත කළ තොරතුරු පසුව ප්‍රයෝජනයට ගැනීම සඳහා ආරක්ෂිතව ගබඩා කර තබා ගැනීමයි.
- ප්‍රතිපෝෂණය - අදාළ පාර්ශ්වයන්ට ප්‍රතිදාන යොමු කිරීම මගින් ආදාන ඇගයීම හෝ අදහස් විමසීම හෝ ප්‍රතිපෝෂණයයි.

පරිගණක ගත කරන ලද තොරතුරු පද්ධතියක් පහත සඳහන් උපාංගවලින් සමන්විත වේ.

1.දෘඩාංග (Hardware)(නිදසුන්- යතුරු පුවරුව, මොනිටරය)
2.මෘදුකාංග (Software) (නිදසුන් - MS Word ,Windows)
3.ජීවාංග (Liveware) (නිදසුන්-පරිගණක වැඩසටහන්කරුවෝ,දත්ත සැකසුම්කරුවෝ)
4.දත්ත (Data)
5.ක්‍රියාපටිපාටි (Procedures)
6.ස්ථිරාංග (Firmware) (නිදසුන්- Microchip, IC)

<u>අභ්‍යාස</u>

1.තොරතුරු පද්ධතියක අවශ්‍යතාව හා වැදගත්කම ලැයිස්තුගත කරන්න.
2.එලදායී තොරතුරු පද්ධතියක් මගින් ඉටු කර ගැනීමට අපේක්ෂිත කාර්යභාරය මොනවාද?